දරුවන් උදෙසා බයිබලයක්

# යේසුස් වහන්සේගේ උත්පත්තිය



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: M. Maillot

සකස්කරන්නා: E. Frischbutter; Sarah S.

අදහසක් වඩා සරල ස්වරූපයකින් ප්‍රකාශ කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2012 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

කලකට පෙර මරියා නම් යුදෙව් කන්‍යාවක්
වෙත, දෙවියන් වහන්සේ ගාබ්‍රියෙල් නම්
දේවදූතයා එවූ සේක. දේවදූතයා ඇයට
කථා කොට නුඹ පුත්‍රයකු වදන්නීය.



උන් වහන්සේට යේසුස් යන
නාමය තබාපන්න, උන් වහන්සේ
මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ
යයි කියනු ලබන්නේය. උන් වහන්සේ
සදාකාලයටම රජකම් කරන
සේක.



''මා පුරුෂයකු නාඳුනන බැවින් මෙය සිදු
වන්නේ කෙසේදැ''යි බියට පත් මරියා
විමසුවාය. දේවදූතයා ඈට උත්තර
දෙමින්, උපදින්නට සිටින තැනැත්තේ
දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ
යයි කියනු ලබන්නේය.
ඔහුට මිහිපිට පියකු
නොමැත.



දේවදූතයා මරියාට කියනුයේ ''නුඹට නෑයා වූ එළිසබෙත් ඇගේ මහලු වයසේදී පුත්‍රයකු පිළිසිඳ ගෙන සිටින්නීය.'' මෙය ද පුදුම හාස්කමකි. ඉතා ඉක්මණින් මරියා එළිසබෙත් බැලීමට ගියාය. ඔවුහු එක්ව දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ.



මරියා ජෝසෙප් නම්
මනුෂ්‍යයකුට විවාහ බස් දී
සිටියාය. මරියා දරුවකු
පිළිසිඳ ඇති බව දැනගත්
විට ජෝසෙප් කැළඹුණේය.
බිහිවීමට සිටින දරුවා
වෙන යම් කෙනෙකුගේ
දරුවෙකැයි ජෝසෙප්
අනුමාන කළා.



සිහිනයකින් ස්වාමින් වහන්සේගේ
දූතයෙක් ජෝසෙප්ට කථා කොට,
''බිය නොවන්න, මොහු දෙවියන්
වහන්සේගේ පුත්‍රයාණෝය. ජේසුස්
වහන්සේ බලාගැනීමට ජෝසෙප්
මරියාට උදව් විය.



ජෝසෙප් දෙවියන් වහන්සේට කීකරුව විශ්වාසවන්තව සිටියේය.
ඔහුගේ රටේ නීතිරීතිවලට ද ඔහු යටත් විය. රටේ පැවති
අලුත් නීතියක් නිසා ජෝසෙප්
සහ මරියා තමන්ගේ
අයබදු ගෙවීම
සඳහා උපන්



බිම වූ
බෙත්ලෙහෙමට
පිටත්ව ගියහ.


මරියා ඇගේ දරුවා බිහි
කිරීමට සූදානමින් සිටියාය.
එනමුත් නැවතීමට සුදුසු
තැනක් සොයාගැනීමට
ජෝසෙප්ට නොහැකි
වියඤ සියලුම තානායම්
ජනයාගෙන් පිරී
තිබිණි.

අන්තිමේදී ජෝසෙප්ට ගව මඩුවක් සම්බ වුණා.
එහිදී ජේසුස් වහන්සේ ඉපදුණා. මව
දරුවා ගව ඔරුවක බාවා
තැබුවා. ගව ඔරුව
යනු ගවයින්ට
ආහාර දමන
තැනක්.




ළඟ අහල පහළ සිටි එඬේරු ඔවුන්ගේ නිදා සිටින බැටළුවන්
රැකබලාගනිමින් සිටියා. දෙවියන් වහන්සේගේ
දුතයා ඔවුනට අනගි
පණිවුඩයක්
රැගෙන
පැමිණියා.

අද දින දාවිත්ගේ නුවර ක්‍රිස්තුස් නම් ගැළවුම්කරු ඉපදී ඇත. ළදරුවා ගව ඔරුවක බහා තිබෙනු ඔබට සම්බ වනු ඇත.




සැණෙකින් බොහෝ දේවදූතයෝ විත් දෙවියන්
වහන්සේට ප්‍රශංසා කරමින් කියනුයේ ''උස් තන්හි
දෙවියන් වහන්සේට මහිමයත් පොළොවෙහි
සමාදානයත් මනුෂ්‍යයන්
කෙරෙහි යහපතත්
සිදු වේවා.''

එඬේරෙක් ඉක්මණින් ගවලෙන වෙත පිය නැඟුවා. දේවදූතයන් ඔවුන්ට පැවසූ පරිදි ජේසුස් නම් ළදරුවා දුටු බව ඔවුහු සැමටම පැවසූහ.





දින හතළිහකට පසුව ජෝසෙප් සහ
මරියා ජේසුස් වහන්සේ රැගෙන
ජෙරුසලම් මාලිගාවට පැමිණියාඦ
එහි සිටි සීමොන් දරුවා ගැන
දෙවියන් වහන්සේට ප්‍රශංසා
කළා. තවද එහිදී දෙවියන්
වහන්සේගේ
දාසියක වූ,
වියපත්ව
සිටි හන්නා
දරුවා දැක
දෙවියන්
වහන්සේට
ප්‍රශංසා
කළාය.





ඔවුන් දෙදෙනාම දැනගත්තා, මේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා, එනම් පොරොන්දු වූ ගැළවුම්කරු බව. ජෝසෙප් පක්ෂීන් දෙදෙනෙකු පූජා කළා. දිළිඳු අය තම අලුත උපන් දරුවන් කැප කිරීමේදී පූජා කිරීමට නියමිත වූ පූජාව එයයි.




ටික කලකට
පසු පෙරදිග සිටි
පඬිවරුනට තරුවක්
මඟින් ජෙරුසලම
වෙත යාමට මඟ
පෙන්විමක්
ලැබුණා. ඔවුහු ජෙරුසලමට
පැමිණ, ''ජුදෙව්වරුන්ගේ රජ
වීමට උපන් දරුවා කොහේද? අපි
ඔහු නැමදීමට ආවෙමු'' යි කීහ.

හොරොද් රජු හට පඬිවරුන් පිළිබඳ අසන්නට ලැබුණා. ජේසුස් බිළිඳා මුණගැසුණු කල තමාට දන්වන්නැයි කලබලයට පත් වු රජු ඔවුන්ගෙන් ඉල්ලා සිටියා. නමුත් ඔහු කළේ බොරුවක්. හෙරොද්ට ජේසු බිළිඳා මරන්නටයි අවශ්‍ය වුණේ.



ජෝසෙප්, මරියා සහ ළදරුවා සිටි
ස්ථානය පිළිබඳව, තාරකාව විසින්
පඬිවරුන්ට නිවැරදි මඟ පෙන්වනු
ලැබුවා. ඔවුහු ජේසුස් බිළිඳා
ඉදිරියේ දණ නමා නමස්කාර
කරමින්, ගෙන ආ
රත්තරං හා සුවඳ
ලාටු පුජා කළා.



රහසින් තම නිවෙස්
කරා යන ලෙස දෙවියන්
වහන්සේ පඬිවරුනට
අනතුරු ඇඟවූ සේක.




හෙරොද් අතිශයින් කෝප වී
ජේසුස් බිළඳා විනාශ කරන්නට
අදිටන් කරගත්තා. නපුරු
අධිරාජයා බෙත්ලෙහෙමේ සිටි
සියලුම දෑවුරුද්දට අඩු දරුවන්
මරා දැමුවා.



නමුත් හෙරොද්ට දෙවියන් වහන්සේගේ පුත්‍රයාට හිංසා කිරීමට නොහැකි වුණා. සිහිනයකින් ලැබුණු අණ පරිදි ජෝසෙප්, මරියා සහ දරුවා රැගෙන ආරක්ෂාව උදෙසා මිසරයට පලා ගියා.

ජෝසෙප්, මරියා
හා ජේසුස් වහන්සේ
හෙරොද්ගේ මරණයෙන්
පසු ජේසුස් වහන්සේ
රැගෙන නැවත
ආවා.



ඔවුහු ගලීල මුහුද අසබඩ පිහිටි
කුඩා නගරයක් වූ නාසරෙත් නුවර ජීවත් වූහ.

යේසුස් වහන්සේගේ

දේව වචනයෙන් එක් කථාවක්

බයිබලයේ

මතෙව් 1-2; ලූක්1-2

''ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ''
ගීතාවලිය 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වූ සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)